චුන්නාකම් හි සිදුවූ ලිංගික අපරාධයක් සහ ඉන් අනතුරුව සිදුවූ දිවි තොර කරගැනීමක් සම්බන්ධයෙන් දිනමිණ පුවත්පත (සැප්.14, 2022) වාර්තා කර තිබිණි.

මෙහි, හදිසි උපකාරක අංක සඳහන් කිරීම, දිවි තොර කරගත් ආකාරය සඳහන් නොකිරීම යනාදී, දිවි තොර කරගැනීම් වාර්තාකරණයේදී පිළිපැදිය යුතු ආචාර ධර්ම කිසිවක් ආරක්ෂා වී නොතිබුණු බවද නිරීක්ෂණය කරන්නට හැකි විනි.

මීට අමතරව, මෙම සිරස්තලය යෙදී තිබුණේ, "අයියා අතින් කිලුටු වූ නංගී..." යන වශයෙනි. එසේම, පුවත් අන්තර්ගතය තුළ අදාළ සහෝදරයා විසින් සහෝදරිය "දූෂණය" කර ඇතැයි සැක පිට ඔහුව අත්අඩංගුවට ගෙන ඇති බවද වාර්තා වී ඇත.

ඔබ සිතන ආකාරයට,

1) ලිංගික අපරාධයක් හැඳින්වීම සඳහා යොදාගන්නා "දූෂණයක්", "කිලුටු වීමක්" වැනි යෙදුම් ඔස්සේ හැඟවුම්කරණය වන්නේ, ලිංගික අපරාධයට මුහුණ පෑවෙකු අපවිත්‍ර වී ඇති බවක් නොවන්නේ ද? එය ලිංගික අපරාධයට මුහුණ පෑවෙකු සමාජය තුළ කොන් කිරීමකට බඳුන් කිරීමට, එම අයගේ ගරුත්වයට ද හානි කිරීමට හේතු නොවන්නේ ද?

2) ඒ අනුව, ලිංගික අපරාධය යනු මෙවැනි අවස්ථාවක් සඳහා වඩාත් යෝග්‍ය යෙදුමක් නොවන්නේ ද? එසේත් නැතිනම්, ඔබට වඩාත් යෝග්‍ය යෙදුමක් යෝජනා කළ හැකිද?

ලිංගික අපරාධයකට මුහුණ පෑවෙකු අපවිත්‍ර වූ බවක් හඟවන යෙදුම් භාවිතයෙන් වළකිමු!